**වත්තේගම නගර සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය.**
**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**
**------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 01 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය.**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වත්තේගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**
**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.**
**---------------------**

පළාත් පාලන ආයතනවල නඩත්තු ඒකක සඳහා අවශ්‍ය මූලික යන්ත්‍ර උපකරණ බෙදා දීම යටතේ පළාත් සභා හා පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයෙන් 2014 හා 2015 වර්ෂවල දී සභාවට ලබා දී තිබූ රු.35,771,461 ක් වටිනා වාහන 04 ක අයිතිය මෙතෙක් සභාවට පවරා නොතිබූ නමුත්, ඒ බව ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 ලැබියයුතු ගිණුම්.**
**-------------------**

2015 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 08 ක එකතු වටිනාකම රු.10,250,468 ක් වූ අතර, එයින් අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.1,990,221 ක් හා අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.2,075,174 ක් වී තිබුණි. එම ශේෂයෙන් 2016 මැයි 20 දිනට තවදුරටත් අය වියයුතු ශේෂය රු.5,591,357 ක් වී තිබුණි.

**1.3.3 ගෙවියයුතු ගිණුම්.**
**-------------------**

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති ණයහිමි ශේෂ 02 ක එකතු වටිනාකම රු.6,431,717 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.2,076,420 ක් වී තිබුණි. එම ශේෂයෙන් 2016 මැයි 20 දිනට රු.3,226,581 ක් තවදුරටත් අයවීමට තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය.

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

-----------------

ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,935,329 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,680,007 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,744,678 ක අඩුවීමක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.

-----------------------------------

(අ) නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

**(i) මෙහෙයුම් ආදායමට අතිරික්තය**

-------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තය මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් ගත් විට එම ප්‍රතිශතයේ පිරිහීමක් පෙන්නුම් කෙරේ.

**(ii) මුළු ආදායම සහ මුළු වියදම.**

-------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයේ මුළු වියදම මුළු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස ගත් විට එම ප්‍රතිශතයේ ඉහළ යෑමක් පෙන්නුම් කෙරෙන අතර, එය මූල්‍ය පාලනය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවේ.

(ආ) සමාලෝචිත වර්ෂයේ සමස්ත ඌනතාවය ඉකුත් වර්ෂයේ සමස්ත අතිරික්තය සමග සැසඳීමේ දී රු.6,696,720 ක අඩුවීමක් නිරීක්ෂණය වන අතර, ඒ සඳහා 2015 වර්ෂයේ ආදායම් විෂයයන් 02 ක අඩුවීම සහ වියදම් විෂයයන් 03 ක වැඩිවීම මූලික වශයෙන් හේතු වී තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය.

-----------------------------------------

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015.01.01 දිනට | | 2015 වර්ෂය | | | 2015 ලැබීම් | | | 2015.12.31 දිනට හිග ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | හිග ශේෂය | ඉදිරියට ලැබීම් | බිල් කිරීම් | අධි ගාස්තු | දුන් වට්ටම්/ කපා හැරීම් | ඉදිරියට ලැබීම් | හිගයෙන් ලැබීම් | 2015 බිල් කිරීම්වලින් ලැබීම් | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,354,379 | 7,394 | 3,018,937 | 186,196 | 203,334 | 196,818 | 974,907 | 1,912,678 | 2,279,168 |
| කඩ කුළී | 133,779 | 30,172 | 2,960,203 | 48,110 | 38,610 | 170,781 | 124,210 | 2,738,625 | 100,038 |
| වෙළඳ බලපත්‍ර | 4,000 | 4,750 | 718,080 | -- | -- | 3,750 | 4,000 | 719,080 | -- |
| වෙනත් ආදායම් | 3,414,715 | 16,623 | 12,699,218 | 42,175 | -- | 19,112 | 3,617,050 | 8,602,500 | 3,934,068 |
| | | | | | | | | | ------------ |
| එකතුව | | | | | | | | | 6,313,274 |
| | | | | | | | | | ======= |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.6,313,274 ක හිග ආදායම් ශේෂයක් නිරීක්ෂණය විය.

**2.3.2 වරිපනම් බදු**

-----------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි 01 දිනට හිග වරිපනම් බදු ශේෂය රු.2,354,379 ක් වූ අතර, 2015 දෙසැම්බර් 31 දින දක්වා බිල් කිරීම් රු.3,018,937 ක් වී තිබුණි. මින් සමාලෝචිත වර්ෂය තුළ දී අය කිරීම් ප්‍රතිශතය පිළිවෙළින් සියයට 41 ක් හා සියයට 63 ක් වූයෙන්, 2015 දෙසැම්බර් 31 දිනට රු.2,279,168 ක හිග වරිපනම් බදු ශේෂයක් නිරීක්ෂණය විය. එම හිගය තුළ මාස 03 සිට වර්ෂ 20 ට වඩා වැඩි කාල පරාසයක හිග හිටි වරිපනම් බදු රු.2,099,644 ක් වූ නමුත්, මේ සම්බන්ධව නගර සභා ආඥා පනතේ 170(2) වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 22 දින වන විට රජයේ ආයතන 09 කින් අය වියයුතු හිග වරිපනම් බදු ශේෂය රු.309,226 ක් වූ අතර, මාස 03 ත් අවුරුදු 12 ත් අතර කාල සීමාවකට අදාළ වූ මෙම හිග මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වරිපනම් බදු නව තක්සේරුව 2013 වර්ෂය අග භාගයේ දී සිදු කර ඇතත්, සභාව විසින් 2007 වර්ෂයේ සිදු කරනු ලැබූ තක්සේරුව පදනම් කර ගෙන 2015 වර්ෂයට ද වරිපනම් බදු බිල් කර තිබුණි.

**2.3.3 බදු කුළී.**

-----------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කඩ කාමර බදු දීමේ දී බදුකරු සමග ගිවිසුම්ගතවීමකින් තොරව සභාව සතු කඩ කාමර 07 ක් බදු දී තිබුණි.

(ආ) පොදු වෙළඳ පොළේ කඩ කාමර 09 ක් හා කඳුරට සංවර්ධන බැංකුව පිහිටි සභාවට අයත් ගොඩනැගිල්ලේ ඉහළ මහලේ කඩ කාමර 10 ක් සඳහා බදුකරුවන් විසින් බදු මුදල් අඛණ්ඩව ගෙවා ඇතත්, ව්‍යාපාර කටයුතු කිරීමකින් තොරව දිගින් දිගටම වසා දමා තිබුණි.

(ඇ) 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය මගින් ඥාතීන් වෙත කඩ කාමරවල බදු අයිතිය පැවරීමට විධි විධාන සළසා නොමැති වුවත්, 2010 අගෝතු 31 දින ගනු ලැබූ මහා සභා තීරණයක් මත සභාව සතු දුම්රිය පොළ පාරේ කඩ කාමර අංක 06, 2010 ඔක්තෝබර් 28 වන දින මුල් බදුකරුගේ ඥාතියෙකුට පවරා දී තිබුණි.

**2.3.4 වෙනත් ආදායම්.**

**(අ) ජල ගාස්තු.**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අය වියයුතු ජල ගාස්තු වූ රු.2,768,476 න් වර්ෂ 01 ත් වර්ෂ 03 ත් අතර කාල පරාසයකට අයත් හිග හිටි ජල ගාස්තු රු.377,069 ක් වූ අතර, මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ii. මංගලගිරි කන්ද හා පුංචි මෝල යන ජල ව්‍යාපෘති 02 හී ජල මනු සවි කර නොතිබුණු අතර, ජල පාරිභෝගිකයින්ගෙන් රු.200, රු.300 හා රු.350 ප්‍රමාණයන්ගෙන් ස්ථාවර ජල ගාස්තු අය කර තිබුණි. මේ නිසා, ජල පාරිභෝගිකයින්ගේ ජල පරිභෝජනයට සාපේක්ෂව ගාස්තු අය කිරීමේ ඉඩ කඩ මග හැරී තිබුණි. එසේම, පිරිසිදු කිරීමකින් තොරව ජලය, පාරිභෝගිකයින්ට ලබා දෙන බවක් ද නිරීක්ෂණය විය.

**(ආ) ත්‍රී රෝද රථ ගාස්තු.**

2015 දෙසැම්බර් 31 දින වන විට හිග ත්‍රී රෝද රථ ගාස්තු රු.378,194 ක් වූ අතර, මෙම මුදල් වසර 01 ත් වසර 05 ත් අතර කාල පරාසයක් තුළ අය නොවී පැවති ඒවා විය.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.474,389 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**3.1 කාර්යසාධන ඇගයීම.**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පූර්ව වර්ෂයේ දී සංවර්ධන යෝජනා ලබා ගෙන ප්‍රමුඛතාවය සකස් කර ඉදිරි වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කරන ව්‍යාපෘතීන් සඳහා විධිමත් පරිදි කාර්මික නිලධාරින්ගේ ඇස්තමේන්තු ලබා

ගෙන අයවැය ඇස්තමේන්තු පිළියෙළ කළයුතු වුවත්, ගොඩනැගිලි වැඩි දියුණු කිරීම හා මාර්ග සංවර්ධන කටයුතු සඳහා රු.5,910,000 ක් ලෙස දළ අගයක් යොදා අයවැය ඇස්තමේන්තු පිළියෙළ කර සම්මත කර ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ අයවැය ප්‍රකාශය අනුව, නගර සභා කාර්යාල ගොඩනැගිල්ල හා ශාලා පරිශ්‍රය වෙළඳ සංකීර්ණය ද සහිතව නවීන අංගෝපාංගයන්ගෙන් සමන්විත නගර ශාලාවක් හා සභා ගර්භයක් ඉදි කිරීම, පැරණි නගර සභා ගොඩනැගිල්ල හා ආහාර දෙපාර්තමේන්තුවේ දුම්රිය අංගන ගබඩා භූමිය ඒකාබද්ධ අංග සම්පූර්ණ වෙළඳ සංකීර්ණයක් ආරම්භ කිරීම, දුම්රිය ස්ථානය අසළින් ආරම්භ වන දුම්රිය මාර්ගයට සමාන්තර විකල්ප මාර්ගය සංවර්ධනය කිරීම, අඩු කුළී නිවාසයන් හී අයිතිය නිවාසලාභීන්ට ලබා දීම සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා කාබනික පොහොර සැකසුම් මධ්‍යස්ථානයක් ජයිකා (JAICA) ආයතනය හරහා ලබා ගැනීමට කටයුතු කිරීම ප්‍රධාන අරමුණු වී තිබුණ ද, එකී ව්‍යාපෘතීන් ආරම්භ කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා අරමුදලින් වැය දරා බාහිර ආයතනවලින් ආපසු අය කර ගතයුතු රු.587,845 ක් ආපසු අය කර නොගෙන සභාවේ පෙර ගෙවුම් වශයෙන් වසර 01 සිට වසර 07 දක්වා කාලයක් පුරා ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක පුරප්පාඩු 08 ක් හා අතිරික්ත තනතුරු 21ක් තිබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 21 වගන්තිය ප්‍රකාරව සැළසුම් අනුමත කළ නිවාස ඉදි කිරීමෙන් පසු ඒ නිවාසවල පදිංචිවීමට පෙර අනුකූලතා සහතික ලබා ගතයුතු අතර, සභාව විසින් 2010 වර්ෂයේ සිට 2015 දක්වා ගොඩනැගිලි සංවර්ධන බලපත්‍ර 269 ක් නිකුත් කර ඇතත්, ඉන් අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ 70 කට පමණි. මේ අනුව, අනුකූලතා සහතික නිකුත් කිරීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) 2015 දෙසැම්බර් 14 දින වන විට ලැබී තිබූ පැමිණිලි හා ඊට අදාළ ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී අනාවරණය වූ අනවසර ඉදි කිරීම් 05 ක් සම්බන්ධයෙන් අනවසර ඉදි කිරීම් කළ පුද්ගලයින් වෙත අනවසර නියෝගය යැවීම හැර වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මගින් 2013 හා 2014 වර්ෂවල දී ලබා දී තිබූ එකතුව රු.158,350 ක මුදල් හා පොදු අරමුදලින් වෙන් කරනු ලැබූ රු.120,000 ක මුදල් ප්‍රතිපාදන උපයෝගී කර ගෙන පරිසර අරමුදලක් පිහිටුවා තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන දිනට එහි ශේෂය රු.278,350 ක් වී තිබුණි. මෙම අරමුදල භාවිතා කර සමාලෝචිත වර්ෂය තුළ දී අදාළ කටයුතු සිදු කිරීමකින් තොරව අරමුදල නිෂ්ක්‍රීයව පැවතුණි. මෙවැනි අරමුදල් පිහිටුවීම සඳහා නගර සභා ආඥා පනතේ නීතිමය ප්‍රතිපාදන නොවීය.

**4.** **යහපාලනය හා ගිණුම් කටයුතුභාවය.**

**4.1** **අයවැය පාලනය.**

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දි ආදායම් විෂයයන් 03 ක සියයට 14 සිට සියයට 41 ක් දක්වා ද, වියදම් විෂයයන් 06 ක සියයට 14 සිට සියයට 80 ක් දක්වා ද විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.2** **වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.**

වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.

**4.3** **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම.**

2014 අගෝස්තු 01 දිනැති CPC/CAM/1/6 දරන මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛ ලිපියේ උපදෙස් පරිදි සෑම වර්ෂයකම කාර්තු අවසානයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් එක් අවස්ථාවක දී පමණක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා තිබුණි.

**4.4** **වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 හා 2015 වර්ෂවල දී පළාත් පාලන අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස සභාවට ලැබී තිබූ රු.25,936,884 ක් වටිනා වාහන 03 ක් 2015 දෙසැම්බර් 28 දින වන විටත් ධාවනය කර නොතිබුණි.

(ආ) "එසැණින් විශ්ව ගම්මානය" සංකල්පය යටතේ මධ්‍යම පළාත් සභාවේ අනුග්‍රහයෙන් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් සඳහා 2014 පෙබරවාරි 25 දින සභාවට ලබා දී තිබූ රු.369,873 ක් වටිනා පරිගණක උපාංග හා කාර්යාල උපකරණ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රීයව තබා තිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශයේ දරු දැරියන්ට සුභ සාධක සේවයක් සැළසීම සඳහා දිගු කාලයක සිට සභාවේ පවත්වා ගෙන ගොස් තිබූ කලා සංසදය 2014 වර්ෂයේ සිට අක්‍රීය වීම හේතුවෙන්, රු.193,500 ක් පමණ වටිනා සංගීත භාණ්ඩ නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඈ) රු.1,984,775 ක් වටිනා වත්කම් වර්ග 05 ක් හා වටිනාකම හඳුනා ගෙන නොතිබූ ජල හා ගොඩනැගිලි උපකරණ අවුරුදු 07 ත් 13ත් අතර කාල සීමාවක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

(ඉ)	ආසියානු සංවර්ධන බැංකුවේ ජල ව්‍යාපෘතියට අදාළ අංක 70573431 දරන ලංකා බැංකුවේ ජංගම ගිණුම හා අංක 074-2-001-9-5239580 දරන මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම භාවිතා කිරීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවති අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එහි ශේෂයන් පිළිවෙළින් රු.117,915 ක් හා රු.3,371 ක් විය.

**5. පද්ධති හා පාලනය.**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ)	අයවැය පාලනය

(ආ)	ගිණුම්කරණය

(ඇ)	අභ්‍යන්තර පාලනය

(ඈ)	ආදායම් පරිපාලනය

(ඉ)	ණයහිමි හා ණයගැති පාලනය